# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2158/41 - 2020 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2020.01.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාවට අනුකූලව අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන රාජ්‍ය අමාත්‍යවරුන් සඳහා විෂයන් හා කාර්යයන් පැවරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නියමය අනුව,

නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍ය, ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍ය, නිවාස රාජ්‍ය අමාත්‍ය භාරයේ පැවතිය යුතු විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන 2020.01.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය (ඉංජි.) ප්‍රියත් බන්දු වික්‍රම,
ලේකම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය.

2020 ජනවාරි මස 13 වැනි දින,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

**ගරු ගාමිණි ලොකුගේ නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. මහනගර, උපනගර හා තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය | 1. නාගරික සංවර්ධන අධිකාරිය | • නාගරික සංවර්ධන අධිකාරිය පනත (1978 අංක 41) |
| 2. නාගරික ප්‍රදේශවල ආර්ථික, සමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු | 2. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව | • නාගරික සංවර්ධන ව්‍යාපෘතීන් (විශේෂ විධිවිධාන) පනත (1980 අංක 2) |
| | | • ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනත (1968 අංක 15) |




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය** (සම්බන්ධිතයි)

**ගරු ගාමිණී ලොකුගේ නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 3. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | |
| 4. පහත් බිම් ගොඩකිරීමේ සහ සංවර්ධනයට අදාළ කටයුතු | | |
| 5. නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මගපෙන්වීම | | |

**ගරු වාසුදේව නානායක්කාර, ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම | 1. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | • ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත (1974 අංක 2) |
| 2. ජල සම්පාන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් විමර්ශනය කිරීම, සැළසුම් කිරීම, නිර්මාණය කිරීම, ඉදිකිරීම, මෙහෙයවීම හා නඩත්තු කිරීම. | 2. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | |
| 3. ප්‍රජා ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති කාර්යක්ෂමව සහ විධිමත්ව ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**ගරු ඉන්දික අනුරුද්ධ, නිවාස රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූලාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 1. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | • ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත (1979 අංක 17) |
| 2. පරිසර හිතකාමී ලෙස පිරිවැය ඵලදායී (Cost. effective) නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳ ග්‍රාමීය ජනතාවට මගපෙන්වීම | 2. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | • නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත (2008 අංක 36) |

01 - 748

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.